# බුදු දහම සහ වෙදකම

ගුණපාල ධර්මසිරි

මූලික වශයෙන් ගත් කල බුදුසමය යනු වෙදකමකි. පාරමාර්ථික ඖෂධයක් නිර්දේශ කරනැයි හඳුන්වනු ලැබ ඇති එකම ආගම එය වන්නේය. විශ්වීය බෞද්ධ සම්ප්‍රදාය තුළ බුදුන් වහන්සේව හඳුන්වා ඇත්තේ මහා වෛද්‍යවරයකු හැටියටය. සියලු රෝගවල උපත වන සසර හෙවත් බව දුක් යන්නට උත්තරීතර ඖෂධ නියම කරන බැවිනි. සියලුම රෝග ඇතිවන්නේ සසර කෙරෙහි අප තුළ ඇති ආකල්ප නිසාය. එම ආකල්ප වෙනස් කිරීමෙන් සියලු රෝග සුවකළ හැකි වන්නේය.

ආයුර්වේදය සහ බුදුසමය අතර ඉතා ගැඹුරු සම්බන්ධයක් ඇත්තේය. ඉන්දියානු වෛද්‍යකමේ හෙවත් ආයුර්වේදයේ ආරම්භය සහ වර්ධනය සඳහා මූලික පදනම සාරවත් වශයෙන් ඉදිරිපත් කරනු ලැබුවේ බුදුසමය මඟින් යැයි ඇත්තවශයෙන්ම කියා සිටිය හැකිය. බ්‍රාහ්මණ වාදය එහි මුල් යුගවලදී සියලු වෛද්‍ය ශාස්ත්‍රවලට විවෘත ලෙසම විරුද්ධ විය. බමුණු දහමින් සියලු රෝග දෙවිවරුන් භූතයින් හෝ කර්මය විසින් ඇතිකරවන්නාවූ දේ හැටියට සැලකිණ. වෙදකම පිළිබඳ අදහසක් වේද ග්‍රන්ථ තුළ තිබුණි. මේ ගැන ජුනම් බාලා මෙසේ කියයි: "කෙසේ වුවත් ඒවා තුළ තිබුණු වෙදකම සංස්ථිතික වූවා මෙන්ම පූජා සහ චාරිත්‍ර විධිවලින් ගහණ වූවක් ද විය. පිළිගත් ඥාන පද්ධතිය තුළට නව කරුණු සහ ප්‍රාගුණයයන් එකතුකිරීමට අවසර දෙවෙන ආකාරයේ විමර්ශන ක්‍රියාවලියක් එහි ඇත්තේ නැත. එසේවුවත්, බ්‍රාහ්මණ ආධිපත්‍යය තිබුණු යුගයේ දී ප්‍රායෝගික වෙදකම තුළට වැදගත් අලුත් කරුණු එකතු කළ බව පසුව පැහැදිලිවන කරුණකි. ඔවුන්ගේ ආගමික දර්ශනයේ තිබුණු සාම්ප්‍රදායිකත්වය සහ වෙදකම සඳහා ඔවුන් තුළ තිබුණු අකමැත්ත යන කරුණු දෙකම ගැන කල්පනාකර බලනවිට ඒ සඳහා පෙළඹවීම ලැබිණියේ බ්‍රාහ්මණ සමාජයෙන් යැයි සිතන්නට අපහසුය.